# මුල් ඓතිහාසික අවධියේ උතුරුමැද පළාතේ සමාජ සැදුම පිළිබඳ පුරාවිද්‍යාත්මක විමර්ශනයක්

ආචාර්ය තුසිත මැන්දිස්[1]
චන්දන රෝහණ විතානාච්චි[2]
[1]මධ්‍යම සංස්කෘතික අරමුදලල [2]සමාජීය විද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය

ශ්‍රී ලංකාවේ පුරාතන අවධීන් සම්බන්ධයෙන් සමාජ පුරාවිද්‍යාත්මක අධ්‍යයන සිදුකිරීමේ දී ප්‍රධාන වශයෙන් එම අවධීන්හි පැවති ජන කණ්ඩායම් හි විවිධත්වය, පරිපාලන සංවිධාන, සමාජ නායකත්වය, සම්පත් පරිහරණය, ආර්ථික ක්‍රියාවලිය, විශේෂ ප්‍රාගුණ්‍යතාවයන් ආදී වශයෙන් හඳුනාගත හැකි නොයෙකුත් ක්ෂේත්‍රයන් ඔස්සේ ජන සමාජයේ විහිදීම අධ්‍යයනය කිරීමට සිදු වේ. එයට ප්‍රධාන හේතුව වන්නේ ජන සමාජයක් යනු විවිධ පරාසයන්ගෙන් යුතු මානව ක්‍රියාවලීන්හි එකතුවක් ලෙස හඳුනාගත හැකි වන බැවිනි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සමාජ පුරාවිද්‍යාත්මක අධ්‍යයන සිදුකොට ඇති පූර්ව පර්යේෂකයින් එකී තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් භාවිත කොට ඇත්තේ අභිලේඛනමය මූලාශ්‍රයන්ය. සෙනරත් පරණවිතානයන් පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන ඇසුරින් එම සමාජයේ විවිධත්වය හඳුනාගැනීමට ගත් උත්සාහය මෙය නිදසුනකි ( IC. Vol I). මීට අමතරව සී. ඩබ්. නිකලස් ප්‍රධාන වශයෙන් ශිලා ලේඛන ද අමතර වශයෙන් වංශකතා මූලාශ්‍රයන් ද උපයෝගී කරගනිමින් පුරාතන සමාජ සම්බන්ධයෙන් විග්‍රහ කිරීමට උත්සාහ ගෙන ඇත ( Nicholas C.W. 1963). ඒ අනුව මුල්කාලයේදී ශ්‍රී ලංකාවේ සමාජ පුරාවිද්‍යාවේ අවකාශ හඳුනාගැනීම පිණිස ශිලා ලේඛන මූලාශ්‍ර කෙරෙහි විශ්වාසයක් තබා කටයුතු කළ බව හෙළි වේ. වංසකතා මූලාශ්‍රයන් සඳහන් තොරතුරු බොහෝමයක් එය රචනා වූ කාලයේ පැවති දේශපාලන පසුබිම, ආගමික හේතු හා රචකයාගේ රුචිකත්වය මත යම් යම් වෙනස්කම්වලට ලක්ව තිබිය හැකි බැවින් එම තොරතුරු කෙරෙහි උදක්ම විශ්වාසය තබාගෙන කටයුතු කිරීම අපහසු වේ. ඇතැම් තොරතුරු ජනප්‍රවාද ඇසුරින් කාලයක් පුරා පැමිණීමේ දී විවිධ විකෘති වීම්වලට ලක්වීමට ඇති ඉඩකඩ ඇති බැවින් වංසකතා මූලාශ්‍ර වල තිබෙන තොරතුරු සම්බන්ධයෙන් ඇතැම්විට ගැටලු මතුකරයි. කෙසේ නමුත් ශිලා ලේඛනගත තොරතුරු සමකාලීන වන බැවින් ද අවශ්‍ය කාරණය කෙරෙහි මූලික අවධානයක් ලබාදී තිබෙන බැවින් ද එම තොරතුරු කෙරෙහි විශ්වාසය තබා කටයුතු කළ හැකි වේ. මෙය ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන වල සිට අනුරාධපුර අවසාන භාගය තෙක් වන ශිලා ලේඛන දක්වාම හඳුනාගැනීමට හැකියාව තිබේ. ඉන් පසු අවධීන් වනවිට යම් යම් අතිශයෝක්තිගත තොරතුරු ඇතැම් ශිලා ලේඛනවල දක්නට ලැබුන ද ඒවායේ දක්වන තොරතුරු වෙනත් සාධක ආදිය පදනම් කරගනිමින් අවබෝධ කරගැනීමේ හැකියාව පවතී

ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික අවධිය වශයෙන් සලකනු ලබන්නේ ක්‍රිස්තු පූර්ව 300 - 100 කාල පරිච්ඡේදයයි. මෙම අවධිය තුළ දී අනුරාධපුරය කේන්ද්‍ර කර ගනිමින් උතුරුමැද පළාත තුළ සමාජ ආර්ථික දේශපාලන ආගමික ක්‍රියාවලිය සාර්ව ආකාරයෙන් කල එළි බැසීම සිදු වේ. මේ තත්ත්වය හඳුනා ගැනීමට මුල් ඓතිහාසික අවධියේ සමාජ පුරාවිද්‍යාව (Social Archaeology) අධ්‍යයනය කිරීම වැදගත් වන අතර එමගින් සමාජ සැදුම පිළිබඳ විමර්ශනයක් සිදු කළ හැකි ය.
මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ පුරාවිද්‍යා දත්ත උපයෝගි කර ගනිමින් මූල ඓතිහාසික අවධිය තුළ උතුරු මැද පළාත ආශ්‍රිතව පැවති සමාජ සැදුම පිළිබඳ විමර්ශනයක් සිදුකිරීම ය. ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර ගවේෂණ ඇසුරින් අනාවරණය කර ගත් දත්ත, ශිලා ලේඛන හා සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය තුළින් තහවුරු කර ගැනීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය විය. උතුරුමැද පළාතේ මුල් ඓතිහාසික අවධියේ සමාජ සැදුම අධ්‍යයනය කිරීමේ දී පූර්ව බ්‍රාහ්මී අභිලේඛන වල සඳහන් තොරතුරු ඉතාම වැදගත් වේ. දැනට සිදු කර ඇති වාර්තාකරණයන් අනුව උතුරුමැද පළාත තුළ පූර්ව බ්‍රාහ්මී අභිලේඛන 402 පවතින බව අනාවරණය වී ඇත (IC,Vol.I: 1-25, 79-93). එම ශිලා ලිපිවල සඳහන් තොරතුරු අධ්‍යයනය කිරීමේ දී පරුමක, ගහපති, ගමික, බරත, බත,' රජ, උපසික, කබර, තොපෂ, තලදර ආදී විශේෂ නාම දැකගත හැකි අතර ඒවා තුළින් එම සමයේ ක්‍රියාත්මක පදවි නාම, ආර්ථික නාම, ආගමික හා සමාජ නාම අධ්‍යයනය තුළින් ඒ යුගයේ සමාජ සැකැස්ම හා ඔවුන්ගේ කාර්යය අධ්‍යයනය කළ හැකි ය. එසේම ශ්‍රී ලංකාවේ අනෙකුත් පළාත් සමග සන්සන්දනය කිරීමේ දී වැඩිම පූර්ව බ්‍රාහ්මී ලිපි ප්‍රමාණය උතුරුමැද පළාත තුළ ස්ථානගත වී තිබීම තුළින් තත්කාලීන සමාජයට එවක පැවති ප්‍රාදේශීය වැදගත්කම හඳුනාගත හැකි වේ.උතුරුමැද පළාත තුළ ස්ථානගත වන බ්‍රාහ්මී ලේඛන තුළ මහරජ/ රජ, පරුමක, ගහපති, ගමික, බත, බරණ යන පදවි නාම සුවිශේෂ වේ. ඔවුන් විසින් සිදු කරන ලද ලෙන් ප්‍රදාන අනුව ශිලා ලිපි ප්‍රමාණයන් ද එකිනෙක වෙනස් වන අතර එසේම ඔවුන් සිදුකළ සමාජ කාර්යභාරයද ඒ තුළ හඳුනාගත හැකි ය.පූර්ව බ්‍රාහ්මී අභිලේඛන අනුව උතුරුමැද පළාත තුළ ජීවත් වූ ජන කණ්ඩායම් අතරින් පාලන බලය මෙහෙය වූ ජන කණ්ඩායම් ලෙස මහරජ හෝ රජ පදවිය දැරුවන් හඳුනාගත හැකි ය. ඔවුන් පරිපාලනය, සම්පත් හැසිරවීම ඇතුලු කටයුතු රාශියක් කර තිබෙන බව හමු වී ඇති ශිලා ලිපි පරීක්ෂාවෙන් පැහැදිලි වේ.

මෙම ජන කණ්ඩායම් අතර පරුමක පදවිය දැරූවන් උතුරුමැද පළාත තුළ කෘෂි හා වාරි කටයුතු වලට සුවිශේෂ දායකත්වයක් දක්වා ඇති ආකාරය පරුමක නගුල්, පරුමක වපිහමික, පරුමක තණ භූමික, පරුමක වියගහ, පරුමක කොට බොජික ආදී තනතුරු දැරීමෙන් පැහැදිළි වේ (IC,Vol.I ). මීට අමතර ව නගර කර්මාන්ත ශිල්ප හා වෙළඳාම ආශ්‍රිත තනතුරු දැරූවන් ලෙස භාණ්ඩාගාරිකවරු (බඩගරික), පුගියහ (වෙළඳ කුල), බෝජක (අයබදු එකතු කරන්නන්), බෝජික (ගම් පාලකයින්), නගරගුහ (නගර පාලක), ගණක (ගණන් තබන්නන්), චුඩ (මැණික්කරුවන්), මහසේනපිත (මහා සේනාධිපති), තඹර (තඹ කරුවන්) ආදී වශයෙන් වූ විශාල ආර්ථික කාර්යභාරයක් සිදු කළ කණ්ඩායම් වේ

මෙම ප්‍රදේශය ජනාවාස වීම කෙරෙහි කෘෂි කර්මාන්තයට අමතරව කලාපයේ ඇතැම් ස්ථානවලින් ඛණිජ වර්ග බහුල වීමද ආකර්ෂණීය හේතුවක් වන්නට ඇත. අධ්‍යයන ක්ෂේත්‍රයට අයත්වන උතුරු මැද, වයඹ හා තදාශ්‍රිත ප්‍රදේශය ඇසුරින් ලෝහ කර්මාන්තය හා සම්බන්ධ විවිධ ශිල්පීය අංශයන්ගේ වර්ධනය සිදුවී තිබෙන බව සෙල්ලිපි ඇසුරින් අනාවරණය කරගත හැකිය ( IC. Vol. I: wxl 490" 925" 1049" 1136). තඹර නොහොත් තඹකරුවන් ( එම. 319, 351-2, 750), කඹර හෙවත් යකඩකරුවන් ( එම. 161), කොළගම හෙවත් ලෝකුරුගම ( එම. 815), තොපෂ හෙවත් බෙලෙක්කරු ( එම. 370) ආදී තොරතුරු මෙම ලේඛනවලින් හෙළි වේ. මීට අමතරව මැණික්කරුවන් සම්බන්ධ තොරතුරු රැසක් ද සෙල්ලිපි ඇසුරින් අනාවරණය කරගත හැකි( එම. 74, 209, 791, 830).මේ හැරුණු විට වාණිජ කටයුතු ද( එම. 356-7, 897) මෙම ප්‍රදේශය ජනාවාස වීමට හේතුවන්නට ඇත. මෙයට අමතරව ගම්කවරුන්, භාණ්ඩාගාරිකයන්, තොටුපල පාලනය කරන්නන්, දූතවරුන්,මැණික්කරුවන් ආදී ලෙස සුවිශේෂ තනතුරු හා බැඳුණු ක්‍රියාවලීන් උතුරුමැද පළාත තුළ සිදු කොට තිබෙන බව හඳුනා ගත හැකි

ක්‍රිස්තු පූර්ව හයවන සියවසින් පසු මෙරට ඇතිවූ වැදගත්ම සිදුවීම වන්නේ මෙරට සම්පත් පැවති ප්‍රදේශ කරා සිදුවූ ඉන්දීය ජන සංක්‍රමණයි ( මව. vii - ix). මේ නිසා මෙරට පූර්ව ඓතිහාසික ස්වදේශික ගෝත්‍රවල අනන්‍යතාව සුරැකුණු බවක් සිතීමට නුපුළුවන. මේ නිසා සිදුවූ ජන මිශ්‍රවීම් හේතු කොටගෙන වඩාත් සංකීර්ණ සමාජයක් ලංකාවේ ගොඩනැගුණු අතර කෘෂික සමාජ, ශිල්ප සමාජ හා වාණිජ සමාජ වශයෙන් ශ්‍රේණි ගතවූ සමාජ ක්‍රමයක ලක්ෂණ පෙන්නුම් කිරීම ආරම්භ විය. අභිලේඛන මගින් පෙන්නුම් කරනුයේ මෙම වෙනස්වීම බව පැහැදිළිය. මෙම තත්ත්වය ලංකාව ස්ථාවර රාජ්‍යයක් කරා යොමුවීමට ප්‍රබල හේතුවක් වූ අතර ම එය මෙරට උතුරුමැද පළාත තුළ වාරි කර්මාන්තයේ ප්‍රගතිය කෙරෙහි ද සෘජුවම බලපෑ කාරණයක් විය.

උතුරුමැද පළාත තුළ මුල් ඓතිහාසික අවධිය තුළ දී ඇති වන්නා වූ මෙම සමාජ තත්ත්වයන් ඉතිහාසයේ ලේඛනගත වී ඇති වංශකතා ඇතුලු සාහිත්‍ය මූලාශ්‍ර වල සඳහන් නොවන අතර මෙම ජන කණ්ඩායම් දැක් වූ දායකත්වය නිසා උතුරුමැද පළාතේ මහා වාරිකර්ම මෙන් ම නගුල් කෘෂිකර්මාන්තයේ කල එළි බැසීම සිදු වී තිබේ. එසේම ප්‍රදේශයේ ඇති නිධිගත සම්පත් හඳුනා ගැනීම සමග විශේෂ ප්‍රාගුණ්‍ය සහිත ශිල්ප කණ්ඩායම් බිහිවීම නිසා ක්‍රිස්තු පූර්ව 300 - 100 වන විට අනුරාධපුරය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානය වූවා පමණක් නොව රටේ පාලන බලය මෙහෙයවන ප්‍රධාන ස්ථානය බවට පත්වීම මේ අවධියේ දී ද හඳුනා ගත හැකි ය. මෙම තත්ත්වය බෞද්ධාගම මෙරට ප්‍රතිස්ථාපනය වීම සමගම මහා පරිමාණ ආකාරයෙන් කල එළි බසිනු ලබන්නේ ශ්‍රී ලංකා ශිෂ්ටාචාරයට ජීවය පිඹින ලද මෙම ජන කණ්ඩායම් සිදුකළ ගුහා ප්‍රදානයක් මගිනි. ඒ අනුව, උතුරු මැද පළාතේ සමාජ සැදුම ආකර්ශනය කිරීම තුළින් එවකට රටේ පැවති ආගමික, දේශපාලනික, ආර්ථික හා සමාජ ක්‍රියාවලිය මැනවින් හඳුනා ගත හැකි බව පැහැදිළි ය.

යතුරු පද : සමාජ පුරාවිද්‍යාවල පූර්ව බ්‍රාහ්මී අභිලේඛනල සමාජ කාර්යභාරයල සම්පත් පරිහරණයල මුල් ඓතිහාසික අවධිය

## ආශ්‍රිත ග්‍රන්ථ

1.මහාවංසය, 1967 සංස්. සුමංගල හිමිල බටුවන්තුඩාවෙ. කොළඹ. :)

2. Nicholas. C.W, 1963, Historical Topography of ancient and Medieval Ceylon. *Journal of Royal Asiatic Society, Ceylon Branch (N.S)* Vol VI.

3. Paranavitana S, 1970, *Inscriptions of Ceylon* Vol. I Part I, Colombo, Department of Archaeology.(IC)